සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

12 ශ්‍රේණිය

# දේශපාලන විද්‍යාවේ මූලිකාංග

පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 - (4) | 2 - (1) | 3 - (5) | 4 - (2) | 5 - (3) | 6 - (2) | 7 - (1) | 8 - (3) | 9 - (2) | 10 - (2) |
| 11 - (4) | 12 - (2) | 13 - (1) | 14 - (4) | 15 - (5) | 16 - (3) | 17 - (2) | 18 - (2) | 19 - (5) | 20 - (3) |
| 21 - (5) | 22 - (2) | 23 - (5) | 24 - (2) | 25 - (4) | 26 - (3) | 27 - (2) | 28 - (4) | 29 - (5) | 30 - (4) |
| 31 - (5) | 32 - (3) | 33 - (2) | 34 - (1) | 35 - (3) | 36 - (1) | 37 - (5) | 38 - (3) | 39 - (2) | 40 - (2) |
| 41 - (4) | 42 - (2) | 43 - (2) | 44 - (3) | 45 - (4) | 46 - (2) | 47 - (4) | 48 - (5) | 49 - (3) | 50 - (2) |

## II කොටස

### A කොටස

(01) (1) විද්‍යාත්මක මූලධර්ම භාවිතාකර නිශ්චිත නිගමනවලට එළඹිය නොහැකි වීම.

(02) (1) සමාජ ක්‍රමය රදළයින්, නිදහස් වැසියන් හා වහලුන් ලෙස ප්‍රධාන ස්ථර 3 කින් යුක්ත වීම.

(2) සමාජයේ බහුතරය වහලුන් වීම.

(03) (1) සමාජය සතු බලයට වඩා උත්තරීතර හා අසහාය බලයක් රාජ්‍යය සතු වීම.

(2) මිනිස් කැමැත්ත හා තාර්කික බුද්ධිය මගින් රාජ්‍යය නිර්මාණය වීම.

(04) (1) නිකලෝ මැකියාවලි (2) ජෝන් ලොග්.

(05) (1) නූතන රාජ්‍යයක් බිහිවීමෙන් පසු එම රටවල ආර්ථික හා සමාජ ක්‍රමයන්හි සිදු වූ වෙනස්කම් වලට අනුව තුන්වන ලෝකයේ රටවල් ආශ්‍රිතව බිහි වූ ජාතික රාජ්‍ය සංකල්පය නව රාජ්‍යය වේ.

(06) (1) ව්‍යවස්ථානුකූලවාදය යනු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පෙන්වා දී ඇති නෛතික රාමුව වෙනුවට අනුගතව රජ්‍යය පාලන කිරීම හා ව්‍යවස්ථාවේ උත්තරීතර භාවය අගය කිරීම.

(07) (1) සමානාත්මතාවය. (2) කම්කරු පන්තියේ ආඥාදායකත්වය.

(08) (1) නීතිය මගින් සාමය හා සුරක්ෂිතභාවය ආරක්ෂා කරන නිසා නීති ස්වාධිපතිගේ ආඥාවක් වන නිසා.

(09) (1) කාර්මික විප්ලවය. (2) ධනවාදය ආරම්භවීම.

(10) (1) ආර්ථික. (2) භූගෝලීය.

### B කොටස

(01) (1)
- දේශපාලන විද්‍යාව පිළිබඳ නිර්වචන
- විවිධ මත
- සමාජ විද්‍යාත්මත ස්වරූප / රාජ්‍යය බිහි වීම.

(02) රාජ්‍යයේ ආරම්භය සහ වර්ධනය / තුලනාත්මක ආණුඩුක්‍රමය / ආණ්ඩුක්‍රම ආයතන / දේශපාලන ක්‍රියාදාම නීතිය / සමාජ සම්බන්ධතා / රාජ්‍ය පරිපාලනය / දේශපාලන පක්ෂ / ජාත්‍යන්තර සබඳතා.

(03) (1) රාජ්‍යයේ ප්‍රභවය සම්බන්ධයෙන් ලිබරල් දේශපාලන මතවාදය පැහැදිළි කරන්නේ සමාජය ක්‍රමික විකාශණයට භාජනය වීමෙන් රාජ්‍ය බිහි වූ බවයි. සමාජයේ පොදු අරමුණු ඉටු කිරීම සඳහා මිනිසුන් එක්ව පිහිටුවා ගත් සංවිධානයක් හැටියට රාජ්‍ය හුවාදක්වන ලිබරල්වාදීන් මෙම උත්තරීතර සමාජ සංවිධානය මිනිසුන්ගේ සමාජ පැවැත්මේ අනිවාර්ය ප්‍රතිඵලයක් ලෙසද දක්වයි. සමාජවාදයට අනුව පන්ති සමාජය බිහිවීමට පෙර රාජ්‍යය නොතිබුණි. රාජ්‍ය බලය එකිනෙකට වෙනස් වූ පන්ති දෙකක් විසින් පාලනය කරන අතර ධනපති පන්තිය රාජ්‍යය පාලනය කරයි.

(2) සම්භාව්‍ය ලිබරල්වාදය තුළ රාජ්‍ය නිර්බාධවාදය දක්නට ලැබුනු අතර රාජ්‍ය නීතිය හා සාමය පමණක් ඉටුකරන සංස්ථාවක් විය. නූතන ලිබරල්වාදයට අනුව එය පොදු ජනතාවගේ උපයෝජනය සඳහා සුභසාධක කටයුතු ඉටුකරන සංවිධානයකි.

(3) ලිබරල්වාදයට අනුව රාජ්‍ය නම් වූ සංස්ථාව යම් යම් වෙනස්කම් වලට භාජනය වෙමින් පවතින්නකි. සමාජ අභිවෘද්ධිය රාජ්‍යයේ කාර්ය බැවින් සමාජය පවතින තුරු අදාළ කාර්යයන් ඉටුකිරීමට රජයද පැවතිය යුතුයි.

(04) (1) රාජ්‍යය සංවිධාන අතර ඉහළම සංවිධානයකි. මේවා බලය / සාමාජිකත්වය / අරමුණු සහ පරමාර්ථ / ව්‍යාප්තිය යන අංශ යටතේ විස්තර කර ඇත්නම් ලකුණු දෙන්න.

(2) රාජ්‍යය හා ආණ්ඩුව

රාජ්‍යය අචේතනික වේ. ආණ්ඩුව සචේතනික වේ. ආණ්ඩුව යනු රාජ්‍යය නොව එහි නියෝජිතයෙකි. රාජ්‍යය පරිපූර්ණ වේ. ආණ්ඩුව එහි කොටසයි. රටක සියලු දෙනාම රාජ්‍යයේ සාමාජිකයින්ය. ආණ්ඩුව පුරවැසියන් කොටසකි.